# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2015

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
Department of Co-operative Development - Sri Lanka

අප ගැන ...........

## දැක්ම

ජනතා ව්‍යවසායකයක් ලෙස තිරසාර
සංවර්ධනයට සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායකයක් ලෙස සංවර්ධනය
කිරීම සඳහා සානුබල සපයමින්,
සමුපකාර සමිතිවල යහ පාලනය
ගොඩනැගීම සඳහා
පුළුල් ලෙස මැදිහත් වීම.

# පෙරවදන

සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය කරමින් එය තිරසාර සංවර්ධනයට දායක කරගැනීමේ අභිප්‍රාය සහිතව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) කටයුතු කරනු ලබයි. සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා අතිශය කැපවීමෙන් උරදෙන මෙම දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා සකස් කරන ලද කාර්ය සාධන වාර්තාව මෙසේ ඔබ අතට පත් කිරීමට හැකිවීම ඉමහත් සතුටට කරුණකි.

සමුපකාර ව්‍යාපාරය තුල නියමු කාර්යභාරයක් ඉටු කරන ආයතනික ව්‍යුහයක් ලෙස සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සෘජු මැදිහත්වීම සහ දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය වී ඇති මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා සංගම් පිළිබඳව අවධානය කරන්නන්ට මෙම වාර්තාව පරිශීලනය කිරීම මගින් පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකිවනු ඇත.

අභියෝගයන්ට මුහුණපා ඇති සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කරමින් සමුපකාර හර පද්ධතීන් ආරක්ෂා කරගනිමින් සාමාජීය අවශ්‍යතා සපුරාලීමට සියළු සමුපකාර නායකයින්ගේ අවධානය යොමු විය යුතු බව ද පෙන්වාදීමට කැමැත්තෙමි.

මෙකී සියළු කාර්යයන් 2015 වර්ෂයේ දී සාර්ථක කරගැනීම සඳහා සහයෝගය දැක්වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරන අතර, විවිධ අභියෝගයන් හා බාධක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුල දායකත්වය සැපයූ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කර සිටිමි.

ඩී. ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

# පටුන

1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය
   1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්
   1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
   1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
      1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
      1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්
      1.3.3 ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්
      1.3.4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්
      1.3.5 ස්ථාන මාරුවී ගිය නිලධාරීන්
   1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
      1.4.1 දේශීය පුහුණු
      1.4.2 විදේශීය පුහුණු
      1.4.3 මහජන බැංකු ආධාර යටතේ සිදු කරනු ලබන පුහුණු වැඩසටහන්
   1.5 රජයේ විගණනය

2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
   2.1 2015 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම
   2.2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම
   2.3 සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම්
   2.4 අක්‍රිය සමිති ඈවර කිරීම
   2.5 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
   2.6 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති කටයුතු
      2.6.1. ආරවුල් බේරුම්කරණය
      2.6.2 උසාවි බලගැන්වීම්
      2.6.3. වර්ෂය තුළ අවසන් වූ නඩු
   2.7 අරමුදල් කළමනාකරණය
      2.7.1 සමුපකාර අරමුදල
      2.7.2 සමුපකාර අතිරික්ත අරමුදල
   2.8 2015 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම්
   2.9 ග්‍රාමීය බැංකු නියාමනය
   2.10 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
   2.11 සැලසුම් කටයුතු
   2.12 මාධ්‍ය කටයුතු

3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
   3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්
   3.2. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති
      3.2.1. දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
      3.2.2. දීප ව්‍යාප්ත නිෂ්පාදන සේවා සමුපකාර සමිති

# පරිච්ඡේදය 01

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව නමින් ආරම්භ වී ඇති අතර, 1945 වසරේ දී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ස්ථාපිත වී ඇත. 2015 වර්ෂයේ අග භාගයේ සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් අංකඃ 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරණ ස්ථානයේ පිහිටා ඇති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධනයකට මඟ පෙන්වමින් සමුපකාර සමිති වල යහපාලනය උදෙසා පුළුල් මෙහෙවරක් ඉටු කිරීමට සමත් වී ඇත.

### 01. 1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල ව්‍යවස්ථාපිත කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
- ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම.

#### ව්‍යවස්ථාපිත කටයුතු

- සමිති ලියාපදිංචි කිරීම
- සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- නිළවරණ කටයුතු
- මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
- ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

## කළමනාකරණ කටයුතු

- ❖ පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ❖ ගිණුම් කටයුතු අධීක්ෂණය
- ❖ විගණනය
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- ❖ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- ❖ පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට සහය වීම.
- ❖ ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- ❖ සමුපකාර සමිති වලට අදාල සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- ❖ වී මිලදී ගැනීම, සහන මිලට පොහොර බෙදාහැරීම වැනි කටයුතු වලදී සමුපකාර සමිති, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම
- ❖ සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

## සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

## අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම
- ❖ ණය ආපසු අයකර ගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

## අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- ❖ සාමාන්‍ය පරිපාලනය.
- ❖ මානව සම්පත් කළමනාකරණය.
- ❖ කාර්ය සාධනය වර්ධනය.
- ❖ වත්කම් කළමනාකරණය.

## 01. 2 දෙපාර්තමේන්තු ව්‍යුහය

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 09 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්,

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය
7. බැංකු නියාමන අංශය
8. ව්‍යාපෘති අංශය
9. සැලසුම් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 01. 3 දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

අප දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි මෙම වසර තුළ සිදු වූ විශේෂි වූ සිදුවීම් කිහිපයකි.

සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් (වැ.බ.) තනතුරේ සේවය කල ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I ශ්‍රේණියේ ධම්මික රාජපක්ෂ මහතාගේ වැඩ බලන කාල සීමාව අවසන් වීමෙන් අනතුරුව 2015.10.19 දින සිට සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඩී. ජීවනාදන් මහතා පත්වීම මෙම වසර තුළ සිදු විය.

දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් (බැංකු/අරමුදල්) තනතුරෙහි සේවය කල එච්.ඒ.ජේ.එස්.එම්. අබේනායක මහතා විශ්‍රාම යාම සහ වැඩ බලන පරිපාලන නිලධාරි තනතුරෙහි සේවය කල පී.ඒ. පතිරත්න මෙය, රාජ්‍ය කළමණාකරණ සහකාර I ශ්‍රේණියේ සේවය කළ එන්. බණ්ඩාරනායක මිය යන නිලධරිනියන් විශ්‍රාම යාම මෙන්ම කාර්යාල කාර්ය සහායක සේවයේ I ශ්‍රේණියේ සේවක මහතුන් තිදෙනෙකු මෙම වසර තුළදී විශ්‍රාම යාම සිදු විය. දැනුමෙන් පරිපූර්ණ හා අත්දැකීම් බහුල නිලධාරීන් සේවයෙන් විශ්‍රාම යෑම දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා ඉමහත් බාධාවක් විය.

එමෙන්ම සමුපකාර සංවර්ධන කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරු පුරප්පාඩුව වෙනුවෙන් නිලධාරීන් උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම ද මෙම වසර තුළ දී සිදු විය.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නවක පත්වීම් ලබා 2015.11.24 වන දින සිට කේ.එම්. මුදිත චමින්ද මහතා සහකාර කොමසාරිස් (පාලන) තනතුරෙහි වැඩ භාරගත් අතර, රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නවක නිලධාරිනියන් දෙදෙනෙක් මෙම දෙපාර්මේන්තුවට අනුයුක්ත වීමද මෙම වසර තුළ සිදු විය.

2015 වසරේ දී පහත සඳහන් වාහන දෙපාර්තමේන්තුව සතුව තිබුණි.

| වාහන වර්ගය | වාහන අංකය |
|---|---|
| TOYOTA "HIACE" VAN | NB - 3531 |
| TOYOTA DOUBLE CAB | PE - 0201 |
| MISUBISHI CAB | PF - 9789 |
| MSUBISHI CAB | PF - 9791 |
| NISHAN CAR | CAD - 1867 |

## 01. 3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා පුරප්පාඩු

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2015.12.31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංශය | තනතුර | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2015-12-31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 (වැ.බ) | - |
| | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III) | 04 | 02 | 02 |
| | ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II, III) | 01 | 01 | 00 |
| | නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 01 | 02 |
| | **එකතුව** | **09** | **05** | **04** |
| තෘතිය මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 00 | 01 |
| | සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය | 05 | 02 | 03 |
| | භාෂා පරිවර්තක | 01 | - | 01 |
| | **එකතුව** | **07** | **02** | **05** |
| ද්විතිය මට්ටම | සමුපකාර සංවර්ධන නිලධාරී I සහ II ශ්‍රේණි | 62 | 05 | 12 |
| | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | | 24 (50) | |
| | සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය | | 21 | |
| | සමුපකාර සංවර්ධන නිලධාරී | 15 | 09 | 06 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 20 | 08 |
| | **එකතුව** | **105** | **79** | **26** |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 05 | 05 | - |
| | කාර්යාල කාර්ය සහායක | 15 | 09 | 06 |
| | **එකතුව** | **20** | **14** | **06** |
| | මුළු එකතුව | **141** | **100** | **41** |

## 01. 3. 2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ආර්.එම්.ඩී.කේ. රත්නායක මෙය | රා.ක.ස III | 2015.09.15 |
| 2 | ඩී.එම්.එස්.එන්. මධුෂානි මෙය | රා.ක.ස III | 2015.09.15 |
| 3 | කේ.එම්. මුදිත චමින්ද මයා | සහකාර කොමසාරිස් III | 2015.11.24 |

## 01. 3. 3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරුවීම් ලබා පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | එස්.ඩී.එන්. ප්‍රනාන්දු මිය | සංවර්ධන නිලධාරී | 2015.02.26 |
| 2 | ආර්.පී.ඩී.එස්. රාජපක්ෂ මයා | රියදුරු | 2015.06.08 |
| 3 | කේ.ඩී.එස්.එස්. අබේරත්න මයා | කා.සේ.සේ. III | 2015.07.13 |
| 4 | එච්.එස්. සම්පත් මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂන සහකාර | 2015.11.02 |

## 01. 3. 4 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

| | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 01 | එන්. බණ්ඩාරනායක මිය | රා.ක.ස. I | 2015.03.17 |
| 02 | එච්.ජී. වීරරත්න මයා | කා.සේ.සේ. I | 2015.07.01 |
| 03 | එච්.ආර්.ජේ.එස්.එම්. අබේනායක මයා | සහකාර කොමසාරිස් | 2015.07.26 |
| 04 | පී.ඒ. පතිරත්න මෙය | පරිපාලන නිලධාරී (වැ.බ.) | 2015.10.08 |
| 05 | ටී.එච්.එන්. සපිඩින් මයා | කා.සේ.සේ. I | 2015.10.17 |
| 06 | ඩබ්.එල්. බැසිල් මයා | කා.සේ.සේ. I | 2015.10.24 |

## 01. 3. 5 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරු ලැබූ දිනය |
|---|---|---|---|
| 1 | බී.කේ.බී.එස්. රුදිගු මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂන සහකාර | 2015.03.15 |
| 2 | එච්.ආර්.ජේ.එස්. සූරියබණ්ඩාර මයා | කා.සේ.සේ. III | 2015.06.01 |
| 3 | ඩබ්.එම්.ඒ.ජේ.ඩී. බණ්ඩාර මයා | රියදුරු II (ආ) | 2015.06.23 |
| 4 | ඒ.ඒ.සී.එස්. අමරසිංහ මිය | රා.ක.ස. III | 2015.07.02 |
| 5 | ඒ.ඒ.එම්.එම්. තිලකරත්න මිය | සංවර්ධන නිලධාරී | 2015.07.09 |
| 6 | ආර්.බී.ටී.ඒ. විමලදාස මයා | කා.සේ.සේ. III | 2015.07.13 |
| 7 | ජේ.එම්.එච්.එන්.ජී. ජයසේකර මෙය | සහකාර කොමසාරිස් III | 2015.09.17 |
| 8 | එච්.එම්.එස්. බණ්ඩාර මිය | සංවර්ධන නිලධාරී | 2015.09.30 |

## 01. 4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 01. 4. 1 දේශීය පුහුණු

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනයේ නම | කාලසීමාව | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජාතික සමුපකාර සංවර්ධන ආයතනය පොල්ගොල්ල | 2015.05.28 | එල්.එච්.සී.අයි. ද සිල්වා මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | විනය ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යාපනය පිළිබඳ ආයතනය | 2015.06.15 - 2015.06.17 | එච්.එස්. ෆොන්සේකා මිය<br>(නියෝජ්‍ය කොමසාරිස්) |
| 3 | Effective Management Skills for Directors | නිපුණතා සංවර්ධන අරමුදල | 2015.06.29 - 2016.06.30 | සී. ෆොන්සේකා මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි අධි ශ්‍රේණිය - රාජකාරී ආවරණ)<br>පී.ඒ. සරත් ආනන්ද මයා<br>(සහකාර කොමසාරිස් - රාජකාරී ආවරණ)<br>බී.එම්.එම්. බන්දුල මයා<br>(සහකාර කොමසාරිස් - රාජකාරී ආවරණ) |
| 4 | දෙමළ භාෂාව පිළිබඳ පුහුණු පාඨමාලාව | ජාතික භාෂා අධ්‍යාපනය සහ පුහුණු ආයතනය | 2015.07.07 - 2015.07.18 | කේ.කේ.සී. හේරත් මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>පී.එම්. රූපරත්න මිය<br>(සංවර්ධන නිලධාරී) |
| 5 | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.07.13 - 2015.07.14<br><br><br><br><br><br>2015.07.15 - 2015.07.16 | ජී.එම්.පී.පී. ජයසුන්දර මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ඩබ්.එම්.එම්.එස්. ප්‍රනාන්දු මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>සුමුදු නන්දසේන මෙය<br>(සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>ඒ.එස්.ජී. සජීවනී මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ඒ.ඒ.ඒ.එන්. අතාවුද මයා<br>(සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>යූ.එස්.ඒ. විජේකෝන් මිය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br><br>පී.ඩී.ටී.එම්. ද සිල්වා මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ඒ.අයි.ඒ. අධිකාරි මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ජී.ආර්.ආර්. පතිරගේ මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එස්.එච්.ටී. තමාලිකා මෙය<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |

| | | | | |
|---|---|---|---|---|
| 6 | කාර්යාල සේවක සේවයේ පුහුණු පාඨමාලාව | ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | 2015.07.17 | ආර්.ඩී.ටී.ඒ. විමලදාස මයා (කාර්යාල සේවක සේවය)<br>එම්.එම්.එම්. සූරියබණ්ඩාර මයා (කාර්යාල සේවක සේවය)<br>එන්.ඒ. නිමල් ජයතිලක මයා (කාර්යාල සේවක සේවය)<br>ජී.එම්.ආර්.ඩී. තෙන්නකෝන් මයා (කාර්යාල සේවක සේවය)<br>එන්.ඩබ්. රනිල් රත්නසිරි මයා (කාර්යාල සේවක සේවය)<br>එච්.ටී. ප්‍රේමසූරිය මයා (කාර්යාල සේවක සේවය) |
| 7 | ප්‍රවාහන කළමනාකරණය | නිපුණතා සංවර්ධන අරමුදල | 2015.07.22 | ආර්.එම්.පී.එස්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 8 | ගබඩාකරණය පිළිබඳ පාඨමාලාව | CETRAC (Construction Equipment Training Center) | 2015.07.30 - 2015.08.27 | කේ.ටී.එම්.එම්. තෙන්නකෝන් මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 9 | කාර්යාල සේවක සේවයේ පුහුණු පාඨමාලාව | ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | 2015.08.21 | කේ.ඩී.එස්.එස්. අබේරත්න මයා (කාර්යාල සේවක සේවය) |
| 10 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.09.01 - 2015.09.03 | ඒ.එස්.ජී. සජීවනී මිය (සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එම්.බී.එස්.ඒ. ද සිල්වා මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 11 | රියදුරන් සඳහා වූ පාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 2015.09.18 - 2015.09.20 | එම්.ආර්.පී. තිලකරත්න මයා (රියදුරු) |
| 12 | පාරිභෝගික සම්බන්ධතා සහ මානව සම්පත් පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.09.21 - 2015.09.22 | කේ.ටී.එම්.එම්. තෙන්නකෝන් මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 13 | Attitudinal Change Through Motivation & Productivity Enhancement | නිපුණතා සංවර්ධන අරමුදල | 2015.09.28 | එස්.ඒ. තලංගම මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 14 | රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව | Department of National Archives | 2015.10.02 | පී.ඒ.එස්. ආනන්ද මයා (සහකාර කොමසාරිස් - රාජකාරී ආවරණ) |
| 15 | වැටුප් පරිවර්තනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.01 - 2015.10.02 | කේ.එම්.මිනෝලි මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>ඩබ්.ආර්.එම්. පෙරේරා මිය (සංවර්ධන නිලධාරි)<br>ජී.එම්.එම්. ගරුසිංහ මිය (රාජ්‍ය කළමණාකරණ සහකාර) |
| 16 | කාර්යාල කළමනාකරණය සහ ආකල්ප වර්ධනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.05 - 2015.10.09 | යූ.එල්.එන්. ධනන්ජලී මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>එල්.ඒ.එස්. ලියනාරච්චි මෙය (සංවර්ධන නිලධාරි) |
| 17 | Gov. Pay | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.09 | එන්.ඒ.එච්. පීරිස් මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>එල්.එච්.එම්.බී. ලංසකාර මිය (සංවර්ධන නිලධාරි) |

| | | | | |
|---|---|---|---|---|
| 18 | ආයතන සංග්‍රහය පිළිබඳ නීති රීති | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.12 - 2015.10.14 | ඒ.එන්. කිඹිය හෙට්ටි මෙය (රාජ්‍ය කළමණාකරණ සහකාර)<br>එච්.එම්.එම්.සී. හේරත් මිය (සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 19 | රජයේ ගිණුම් පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.16 | ජී.ආර්.ආර්. පතිරගේ මයා (සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ජී.එම්.එම්. ගරුසිංහ මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 20 | රජයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.19 - 2015.10.20 | ජී.එච්.ඒ. විජේසිංහ මෙය (සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ජී.කේ.සී. නිලංගිකා මිය (අරමුදල් ලිපිකරු)<br>කේ.ඩී.ආර්. නිලන්ති මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>ඒ.එස්. ගංගා සජීවනී මිය (සමුපකාර සංවර්ධන නිලධාරි) |
| 21 | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් සඳහා පුහුණු වැඩසටහන් | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල | 2015.10.19 - 2015.10.20 | පී.ඒ.එස්. ආනන්ද මයා (සහකාර කොමසාරිස් - රාජකාරි ආවරණ) |
| 22 | E-Government | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.21 - 2015.10.22 | එල්.ඒ.එස්. ලියනාරච්චි මෙය (සංවර්ධන නිලධාරි) |
| 23 | රජයේ විගණන කටයුතු පිළිබඳ වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015.10.22 - 2015.10.23 | ටී.ඒ.ජේ.ආර්. ජයතිලක මයා (අරමුදල් ලිපිකරු) |
| 24 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අමාත්‍යාංශය | 2014.11.28 | බී.එම්.එම්. බන්දුල මයා (සහකාර කොමසාරිස් - රාජකාරි ආවරණ)<br>පී.ඒ. පතිරත්න මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>කේ.එච්.ජී.කේ කුමාර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර)<br>එම්.එන්.එල්. පීරිස් මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>කේ.ආර්.ටී. සෝමරත්න මිය (සංවර්ධන නිලධාරි)<br>යූ.එල්. නිපුනි ධනංජලී මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 25 | ව්‍යාපෘති හා ජීවිතය සමබර කර ගැනීම සඳහා භාවාත්මක බුද්ධිය වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2016.11.26 | කේ.ඒ.ඩී.පී.එල්. කහඳවල මයා (සමුපකාර සංවර්ධන නිලධාරි)<br>එස්.ඩී.එන්. ප්‍රනාන්දු මිය (සංවර්ධන නිලධාරි)<br>ඩී.එම්.එස්.සී.බී. දහනායක මයා (සමුපකාර සංවර්ධන නිලධාරි)<br>ටී.එන්.කේ. සේනාරත්න මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>එම්.බී.එස්.ඒ. ද සිල්වා මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| | | | 2016.12.07 - 2016.12.09 | එම්.එන්.එල්. පීරිස් මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>කේ.එච්.එම්.ඩී. ලක්ෂාන්ති මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර)<br>කේ.අයි. පෙරේරා මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |

## 01. 4. 2 විදේශීය පුහුණු

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපනය හා පුහුණු පාඨමාලාවන්ට සහභාගිවී ඇත.

| අනු අංකය | වැඩසටහන | කාල පරිච්ඡේදය | සහභාගී වූ නිලධාරින් |
|---|---|---|---|
| 01 | සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමනාකරණය හා ග්‍රාමීය මූල්‍ය ආයතනය ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීම | 2015.09.14 - 2015.09.18 | එම්.බී.එස්. ද සිල්වා මිය<br>කේ.එච්.එම්.ඩී. ලක්ෂාන් මිය<br>(සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 02 | ග්‍රාමීය මට්ටමේ අඩු ආදායම් ලබන කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 2015.11.29 - 2015.12.12 | එස්.කේ.එන්. නන්දසේන මෙය<br>(සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |

## 01. 4. 3 මහජන බැංකු ආධාර යටතේ සිදු කරනු ලබන පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|
| 01 | සංඛ්‍යා ලේඛන වැඩමුළුව | 2015.03.20 | පළාත් දෙපාර්තමේන්තු නිලධාරින් |
| 02 | සමුපකාර සමිති /සංගම්වල ගිණුම් විගණන කටයුතු යාවත්කාලීන කිරීම හා ගැටළු සාකච්ඡා කිරීම | 2015.07.21 | සමුපකාර සමිති / සංගම්වල සභාපතිවරුන් සහ සාමාන්‍යාධිකාරීවරුන් |
| 03 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.07.25 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 04 | සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා ආරවුල් බේරුම්කරණය | 2015.08.08 | සමුපකාර සංවර්ධන නිලධාරින් සහ සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර |
| 05 | විගණන හා ක්ෂේත්‍ර නිලධාරින් දැනුවත් කිරීම | 2015.08.24 | සමුපකාර සංවර්ධන නිලධාරින් සහ සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර |
| 06 | සමුපකාර සංවර්ධනය පිළිබඳ දැනුම ආකල්ප වැඩිදියුණු කිරීමේ සහ සමුපකාර නීතියේ මූලිකාංග පිළිබඳව වැඩමුළුව | 2015.09.18 සහ 19 | සමුපකාර සංවර්ධන නිලධාරින් සහ සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර |
| 07 | ආනයන අපනයන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2015.09.20 සහ 21 | සමුපකාර සංවර්ධන නිලධාරින් සහ සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර |
| 08 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිති නිලධාරිනියන් සඳහා තීරකකරණ වැඩමුළුව | 2015.10.06 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිති නිලධාරිනියන් |

## 01. 5 රජයේ විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ අවසන් ගිණුම් විගණනය කිරීම සිදු කරන අතර, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් කාර්තුමය වශයෙන් සිදු කරනු ලබයි.

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්යයන් වලට අදාළව රජයේ විගණන අංශය විසින් විගණන විමසුම් 22ක් එවා ඇති අතර, ඉන් විගණන විමසුම් 20ක් සඳහා පිළිතුරු යවා අවසන් කර ඇත.

# පරිච්ඡේදය 02

## සංවර්ධන ක්‍රියාකාරකම්

### 02. 1 2015 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

2015 වසරේ නව සමිති කිහිපයක්ම ලියාපදිංචිය සඳහා ඉල්ලීම් කර ඇති, අතර මේ වන විටත් ඒවායෙහි කටයුතු සිදු වන බැවින් 2015 වසරේ කිසිඳු නව සමිතියක් ලියාපදිංචි කිරීම සිදු නොවීය.

### 02. 2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

| සමිතියේ/ සංගමයේ නම | අතුරු ව්‍යවස්ථා සංශෝධනය අනුමත කළ දිනය |
|---|---|
| සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | 2015.01.29 |
| සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගනුදෙණු සමුපකාර සමිති මහා සංගමය | 2015.05.20 |
| සී/ස ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු සමුපකාර සමිති මහා සංගමය | 2015.07.28 |
| සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | 2015.08.10 |
| සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | 2015.11.09 |
| සී/ස බ්‍රවුන්ස් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | 2015.11.27 |

### 02. 3 සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම්

| සමිතියේ/ සංගමයේ නම | නිලවරණය පැවැත්වූ දිනය |
|---|---|
| සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | 2015.02.20 |
| සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | 2015.03.20 |
| සී/ස රාජ්‍ය ඉන්ජිනේරු සංස්ථායිය සකසුරුවම්කම ණය ගනුදෙණු සහ සුභසාධන සමුපකාර සමිතිය | 2015.03.20 |
| සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභසාධන සමුපකාර සමිතිය | 2015.03.26 |
| සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 2015.03.28 |
| සී/ස ශ්‍රී ලංකා වරාය නැව් සේවා සමුපකාර සමිතිය | 2015.04.24 |
| සී/ස යහජීවන සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2015.06.10 |
| සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීමේ සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2015.11.04 |
| සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 2015.12.05 |
| සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | 2015.12.27 |

## 02. 4 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

2015 වසරේ දී අක්‍රිය සමිති 16ක් හඳුනා ගෙන ඇති අතර, සී/ස ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සමුපකාර බැංකු සමිතියේ ඈවර කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා මේ වන විට ඈවරකරුවෙකු පත්කර ඇත.

<u>ඈවර සමිති ලේඛනය</u>

❖ ලියාපදිංචිය අවලංගු කළ සමිති

1. සී/ස ලේකබයින්ගේ සමුපකාර සමිතිය
2. සී/ස ශ්‍රී ලංකා කළමනාකරණ උපදේශන සේවා සමුපකාර සමිතිය
3. සී/ස ශ්‍රී ලංකා කලා නිර්මාණ ශිල්පී සමිතිය
4. සී/ස ශ්‍රී ලංකා විගණක සේවා සමුපකාර සමිතිය
5. සී/ස සමස්ත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන ඉතිරි කිරීමේ කටයුතු පිළිබඳ සමුපකාර සමිතිය
6. සමස්ත ලංකා අබුධාවේ යාත්‍රා බඳු කරුවන්ගේ ධීවර සමුපකාර සමිතිය
7. සී/ස සමස්ථ ලංකා තාක්ෂණික සමුපකාර සමිතිය
8. සී/ස ශ්‍රී ලංකා ආරක්ෂක සේවයේ සුභසාධක සමුපකාර සමිතිය
9. සී/ස ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සුභසාධක සමුපකාර සමිතිය
10. සී/ස ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

❖ ලියාපදිංචිය අවලංගු කිරීමට නියමිත සමිති


1. සී/ස ශ්‍රී ලංකා ආයතනික සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර මහා සංගමය
2. සී/ස ශ්‍රී ලංකා ජන කලා භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය
3. සී/ස ශ්‍රී ලංකා වරාය සේවා සැපයුම් සමුපකාර සමිතිය


❖ වාර්තා ලබා ගැනීමට යොමු කර ඇති සමිති

1. සී/ස සමස්ථ ලංකා සමුපකාර කාන්තා එකමුතු සමිතිය
2. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර කාන්තා මහා සංගමය

## 02. 5 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

| වර්ෂය | සැලසුම් කළ විගණන | නිමකළ විගණන | වර්ෂය තුළ නිමකළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2009 | 55 | 45 | 82% |
| 2010 | 58 | 53 | 91% |
| 2011 | 66 | 64 | 97% |
| 2012 | 83 | 63 | 76% |
| 2013 | 74 | 61 | 82% |
| 2014 | 68 | 44 | 64.7% |
| 2015 | 80 | 11 | 13.75% |




## 02. 6 නීති කටයුතු

### 02. 6. 1 ආරවුල් බේරුම්කරණය

1992 අංක 11 හා 1983 අංක 32 දරණ සංශෝධන පනත් සමග කියවෙන 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති වලින් බේරුම්කරණය සඳහා 2015 වසර තුළ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගොනුවල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | එකතුව |
|---|---|
| 2015.01.01 දිනට බේරුම්කරු වෙත යොමු කිරීමට පවතින ගොනු සංඛ්‍යාව | 504 |
| 2015 වර්ෂයේ බේරුම්කරණය සඳහා ලද ගොනු සංඛ්‍යාව | 08 |
| 2015 වර්ෂයේ ආරවුල් බේරුම්කරණය සඳහා යොමු කිරීම | 47 |
| 2015.12.31 දිනට බේරුම්කරණය සඳහා යොමු කිරීමට ඇති සංඛ්‍යාව | 465 |
| 2015 වර්ෂය තුළ තීන්දු ලබාදී ඇති ගොනු | 56 |

## 02. 6. 2 උසාවි බලගැන්වීම්

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබා දීමෙන් පසු අදාල මුදල් අය නොවන්නේනම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල දඩ මුදලක් සේ අය කර ගැනීමට අදාල මහේස්ත්‍රාත් අධිකරණයන් හි බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාල සමුපකාර සමිතිය වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

| | |
|---|---|
| 2015.12.31 දිනට වර්ෂය ආරම්භයේ උසාවිගත කිරීමට තිබූ ඉල්ලීම් සංඛ්‍යාව | 1072 |
| 2015 වර්ෂය තුළදී උසාවිගත කිරීමට ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 99 |
| 2015 වර්ෂය තුළදී උසාවිගත කළ බේරුම්කරණ තීන්දු සංඛ්‍යාව | 290 |
| 2015.12.31 දිනට උසාවි බලගැන්වීමට ඇති ඉල්ලීම් ලිපි සංඛ්‍යාව | 881 |

## 02. 6. 3 වර්ෂය තුළ අවසන් කළ නඩු

| නඩු අංකය | පාර්ශවකාර සමිතිය |
|---|---|
| DSP 00074 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණය ගනුදෙණු සමිතිය |

## 02. 7 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) (ආ) වගන්තිය සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදල ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවක තීරණ අනුව කළමනාකරණය කරනු ලබයි.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

## 02. 7. 1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

**2015 වසර තුළදී සමුපකාර අරමුදලින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපාති**

| | අරමුදල් ලබා දුන් ආයතනය | මෙම වසර තුල ලබාදුන් ආධාර මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | නැණ ශක්ති වැඩසටහන | 319,450.00 |
| 02 | බැංකු නියාමන වැඩසටහන | 774,969.00 |
| | **එකතුව** | **1,094,419.00** |

## 02. 7.2 සමුපකාර අතිරික්ත අරමුදල

අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44 (iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වන අතර, මෙම වර්ෂය තුලදී පළාත් සමුපකාර සමිති වල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සහන පොලි ප්‍රතිශතයක් යටතේ පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

### සමුපකාර අතිරික්ත අරමුදල - ආධාර ලබා දීම - 2015

| | සමිතියේ නම | ලබාදුන් දිනය | වටිනාකම | කාරණය |
|---|---|---|---|---|
| 1. | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 2015.05.29 | රු. 887,500.00 | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ශ්‍රවනාගාරය විවෘත කිරීමේ උත්සවයට පැමිණෙන ආරාධිත අමුත්තන් වෙනුවෙන් ආහාර සැපයීම සඳහා Ransara in and our (PVT) LTD ගෙවීම |
| 2. | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 2015.05.29 | රු. 425,544.00 | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ශ්‍රවනාගාරය විවෘත කිරීමේ උත්සවයට පැමිණෙන සමුපකාරිකයින් සඳහා සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා Cleantein (PVT) LTD ගෙවීම |
| 3. | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 2015.05.29 | රු. 291,312.00 | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ශ්‍රවනාගාරය විවෘත කිරීමේ උත්සවයේ ශ්‍රවනාගාරයේ අභ්‍යන්තර පුටු හා බිම පිරිසිදු කිරීම සඳහා ගෙවීම Abans Environmental Service (PVT) LTD |
| | **එකතුව** | | **රු. 1,604,356.00** | |

### සමුපකාර අතිරික්ත අරමුදල - ආධාර ණය ලබාදිම - 2015

| | සමිතියේ නම | ලබාදුන් දිනය | වටිනාකම | කාරණය |
|---|---|---|---|---|
| 1 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2015.07.13 | රු. 1,000,000.00 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී හා සණස සමිතිය සාමාජිකයින්ට ණය පහසුකම් සැපයීම සඳහා අමුදල් ලබා දීම |

## 02. 8 2015 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම

| වැය විෂය අංකය | කාණ්ඩය/ වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2015-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 23,690,000.00 | 21,063,737.31 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 775,000.00 | 577,724.19 |
| 1003 | වෙනත් දීමනා | 13,650,000.00 | 25,852,323.01 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 2,000,000.00 | 2,313,466.86 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 800,000.00 | 104,350.27 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,050,000.00 | 1,046,350.85 |
| 1202 | ඉන්ධන | 2,500,000.00 | 2,280,680.00 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 100,000.00 | 94,789.80 |
| 1301 | වාහන | 1,470,000.00 | 2,054,028.13 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 685,000.00 | 460,067.13 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 900,000.00 | 899,461.61 |
| 1403 | විදුලිය හා ජලය | 1,680,000.00 | 2,471,922.57 |
| 1404 | කුලිය හා දේශීය බදු | 750,000.00 | 297,804.77 |
| 1405 | වෙනත් | 2,100,000.00 | 1,824,582.39 |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 350,000.00 | 350,000.00 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 500,000.00 | 508,433.64 |
| | **එකතුව** | **53,000,000.00** | **62,199,722.53** |

### මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2015-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | 77,700.00 |
| 2003 | වාහන | 400,000.00 | 657,340.00 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 300,000.00 | 299,976.10 |
| 2103 | යන්ත්‍ර සහ උපකරණ | 300,000.00 | 237,631.00 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 105,000.00 | 71,000.00 |
| 2502-1 | ප්‍රකාශනය හා ප්‍රචාරණය | 406,000.00 | 248,812.78 |
| 2502-2 | මූල්‍ය සේවා නියාමන | 8,250,000.00 | 5,219,809.02 |
| 2502-3 | සමූපදීපනී | 5,844,000.00 | 5,152,842.00 |
| 2502-4 | කෘෂි කාර්මික සමුපකාරය සඳහා දේශිය වැඩසටහන් | 7,240,000.00 | 5,451,747.98 |
| | **එකතුව** | **23,205,000.00** | **17,416,858.88** |

### වියදම්

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | 2015-12-31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 53,000,000.00 | 62,199,722.53 |
| 02 | මූලධන වියදම් එකතුව | 23,205,000.00 | 17,416,858.88 |
| | **මුළු එකතුව** | **76,205,000.00** | **79,616,581.41** |

## 02. 9 ග්‍රාමීය බැංකු නියාමනය

සමුපකාර හා අතිරික්ත අරමුදල මගින් සමුපකාර සමිති වෙත ලබා දී ඇති ණය අතුරින් අක්‍රිය වී ඇති ණය අයකර ගැනීමට විශේෂ වැඩපිළිවෙලක් මෙම වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

- පෙර වර්ෂයේ දී හඳුනාගත් ණය ශේෂ ඇති සමිති ක්‍රියාකාරීත්වය පළාත් දෙපාර්තමේන්තු වෙතින් ලබා ගැනීම.
- සමුපකාර සමිති 14 ක් කැඳවා ණය සක්‍රිය කර ගැනීමේ එකගතාවය ලබා ගැනීම
- එකගතාවය අනුව ණය අයකර ගැනීම

    - සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස සඳලංකා විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස මාදම්පේ විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස ආනමඩුව විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස රත්නපුර විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස බුලත් කොහුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස අටකලන්න විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස කඩුගන්නාව විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස හොරොව්පතාන විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස කැබිතිගොල්ලෑව විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස රාජාංගන ගිරිබාව විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස අකුරුස්ස විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස උඩපළාත විවිධ සේවා සමුපකාර සමිතිය
    - සී/ස මොණරාගල දිස්ත්‍රික් සමුපකාර දෙපාර්තමේන්තු සහ ණය පිළිබඳ සමුපකාර සමිතිය

සමුපකාර ක්ෂේත්‍රයේ මූල්‍ය ක්‍රියාකාරකම් හි නියුතු සමිති හා සංගම්වල මූල්‍ය විනයක් ඇති කිරීම, එම අංශ ශක්තිමත් කිරීම හා යහපාලනය තුළින් සමුපකාර මූල්‍ය අංශය ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කරන ලද බැංකු නියාමන ඒකකය 2015 වර්ෂය තුලදී පහත සඳහන් සංවර්ධන කාර්යයන්හි යෙදී ඇත.

| ක්‍රියාකාරකම් | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | ලගාකර ගැනීම | වෙන් කිරීම රු. මිලි | සත්‍ය වියදම රු. මිලි |
| තොරතුරු හා දත්ත රැස්කිරීම | | ඉල්ලුම් කරන තොරතුරු අප්‍රමාදව ලබා දීම | තොරතුරු හා දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි | 8.25 | 5.1 |
| ජාතික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | රැස්වීම් ගණන | රැස්වීම් 03 | - | | |
| අඛණ්ඩ හා වෙනත් පරීක්ෂණ පැවැත්වීම | පරීක්ෂණ ගණන | පරීක්ෂන 15 | සමුපකාර සමිති 10ක ස්ථානීය පරීක්ෂණ | | |
| ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම | කැඳවූ සමිති ගණන | සමිති කැඳවීම් 15 | ස්ථානීය පරීක්ෂණ පවත්වන ලද සමිති 10 කැඳවා හඳුනාගත් දුර්වලතා පිළිබඳ දැනුවත් කර ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දීම | | |
| මූල්‍ය අංශය සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම | වර්ෂය තුළ සිදු කරන ලද පර්යේෂණයන් සහ ඉදිරිපත් කරන ලද වාර්තා ප්‍රමාණය | පර්යේෂණයන්ගේ අවසන් වාර්තාව ලබා ගෙන පළාත් වෙත නිකුත් කිරීම | එෆ් 28 වාර්තාව හා නව විගණන වාර්තාව සකස් කර අවසන් කිරීම හා පළාත් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම පළාත් වෙත ලබා දීම | | |
| | | | සමුපකාර ග්‍රාමීය බැංකු ශ්‍රේණි ගත කිරීම | | |
| | | | ග්‍රාමීය බැංකු මෙහෙයුම් අත්පොතේ කෙටුම්පත සකස් කර අවසන් කිරීම | | |
| ඌනතා හඳුනා ගැනීම | ඉදිරිපත් වී ඇති ගැටළු සහ ඌනතා ප්‍රමාණය | ගැටළු හා ඌනතා සඳහා සෘජුව හා පළාත් කොමසාරිස්වරුන් හරහා පිළිතුරු ලබා දීම | ඉදිරිපත් වන ගැටළු සම්බන්ධව පළාත් නිර්දේශයන් ලබා ගැනීම | | |
| යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම | පහසුකම් ලබා දුන් සමිති ගණන | පළාතකට සමුපකාර සමිති 02 බැගින් වූ සමිති 18 | දකුණු පළාත් ග්‍රාමීය බැංකු නවීකරණ වැඩසටහන් යටතේ අමාත්‍යාංශයෙන් ලබා දුන් මුදලින් නියමිත පරිදි එම නවීකරණ කටයුතු සිදු කර ඇත්දැයි පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දීම | | |
| මානව සම්පත් සංවර්ධනය කිරීම | පැවැත් වූ පුහුණු වැඩමුළු ගණන | පුහුණු වැඩමුළු 38 | නව විගණන ආකෘති හඳුන්වා දීම හා ගිණුම්කරණ ප්‍රමිති භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් 12ක් පැවැත්වීම | | |
| | | | පුහුණුකරුවන් පුහුණු කිරීමේ එක් වැඩසටහනක් පැවැත්වීම | | |
| | | | නියාමන ක්‍රමවේද පිළිබඳ පොළොන්නරු දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | | |

## 02. 10 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

## 2015 වර්ෂයේ දී සියළුම පළාත් සම්බන්ධ කරගනිමින් සිදු කරන ලද වැඩසටහන්

01. පළාත් සමුපකාර අමාත්‍ය සමුළුව 2015.02.07

රජය විසින් අතුරු අයවැයෙන් අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා ලබාදුන් සහන මහජනතාවට නිසි පරිදි ලබා දීමට සමුපකාර සමිති සතු වෙළඳසැල් උපයෝගී කර ගැනීම හා ගොවි ජනතාවගේ නිෂ්පාදන මිලදී ගැනීමට සෘජුවම සමුපකාර සමිති මැදිහත්වීමේ අවශ්‍යතාවය සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පළාත් සමුපකාර අමාත්‍යවරුන්ගේ සමුළුවක් 2015.02.09 දින කොළඹ 02, චොක්ෂොල් වීදිය, සතොස ගොඩනැගිල්ලේ දී පවත්වන ලදී. මෙම සමුළුව සඳහා පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරු සහ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද සහභාගී වූහ.

02. පළාත් සමුපකාර හමුව

අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය බෙදාහැරීම විධිමත් කිරීමේ අරමුණින් මධ්‍යම, උතුරු මැද, වයඹ, සබරගමුව යන පළාත් සම්බන්ධ කර ගනිමින් සමුපකාරික හමුවක් 2015.02.24 දින පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ දී පවත්වන ලදී.

03. පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හමුව

සමුපකාර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමසා බැලීමේ සාකච්ඡාවක් පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් සම්බන්ධ කරගනිමින් 2015.11.26 දින වාණිජ හා කර්මාන්ත කටයුතු අමාත්‍යාංශයේ දී පවත්වන ලදී.

04. NEDAC අධ්‍යාපන චාරිකාව

කෘෂිකාර්මික සමුපකාරිකයින්ගේ සංවර්ධනය සඳහා වූ සහයෝගීතා ජාලයේ (NEDAC) 2014 වාර්ෂික මහා සභා රැස්වීම බංගලාදේශයේ බොකුරා නුවර පවත්වන ලද අතර, එම රැස්වීමේ දී කරන ලද ඉල්ලීමකට අනුව සාමාජික සංවිධානවල නියෝජිතයන් සඳහා අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කරන ලදී. NEDAC සංවිධානයේ දී රිදී ජුබිලිය සමරනු වස් සංවිධානය කරන ලද මෙම අධ්‍යාපන චාරිකාවේ ප්‍රධාන අරමුණ වූයේ සාමාජිකතවය ලබා ඇති සමුපකාර සංවිධානවලට අයත් රටවල සමුපකාර ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා අත්දැකීම් හා අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව සැලසීමයි. ඒ අනුව රුපියල් මිලියන 5.36 ක වියදමින් ඉන්දියාව, බංගලාදේශය හා නේපාලය යන රටවල සාමාජික සමුපකාර සංවිධාන වල නියෝජිතයින් 37 ක ගේ සහභාගීත්වයෙන් 2015 මැයි මස 10 වන දින සිට 17 වන දින දක්වා මෙය සංවිධානය කරන ලදී.

05. සුපිරි වෙළඳසැල් ඉදි කිරීම

2015 වර්ෂයේ දී තවත් එක් සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සුපිරි වෙළඳසැල් සංකල්පය, සමුපකාර ව්‍යාපාරය තුළ ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් අප දෙපාර්තමේන්තුවේ අධීතාක්ෂණය යටතේ දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් සී/ස ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිතිය සඳහා මෙගා කොප්සිටි සුපිරි වෙළඳසැලක් ආරම්භ කිරීමට අමාත්‍යාංශ මූලධන යටතේ රුපියල් මිලයන 2.5 ක මුදලක් ලබා දෙන ලදී.

06. ඒකාබද්ධ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ වැඩසටහන

පළාත් මට්ටමින් පාරිභෝගික ජනතාවට ඉහළ ගුණාත්මක භාවකින් යුක්ත අත්‍යාවශ්‍ය භාණ්ඩ 08 ක් සාධාරණ මිලකට ලබා දීමට සතිපතා මිල කැඳවීම පළාත් මට්ටමින් සිදු කරන අතර, ඒ හරහා පාරිභෝගික ජනතාවට සාධාරණ මිල ගණන් යටතේ භාණ්ඩ ලබා දීමට කටයුතු කරයි.

## 02. 11 සැලසුම් කටයුතු

- සංඛ්‍යා ලේඛන වාර්තාව

    මෙම සංඛ්‍යාන වාර්තාව මගින් සමුපකාර සංවිධාන සම්බන්ධ මූලික තොරතුරු මෙන්ම සමුපකාර සංවිධානයන්හි කාර්ය සාධනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු හා මෙරට ආර්ථිකය තුල සමුපකාර ව්‍යාපාරය තරගකාරීව ක්‍රියාත්මකවන ආකාරයත් ජාතික සංවර්ධනයේ දී ඒ තුලින් ලැබෙන දායකත්වයත් විස්තරාත්මකව දක්වමින් 2014 සංඛ්‍යාන වාර්තාව එළි දැක්වීම සිදුවිය.

- මාර්ගෝපදේශ සංග්‍රහය

    රාජ්‍ය පෞද්ගලික හා වෙනත් විවිධ පාර්ශවයන් සඳහා සමුපකාර ක්ෂේත්‍රයට අදාළ වූ දත්ත හා තොරතුරු ඇතුලත් කරමින් සකස්කරනු ලබන වාර්ෂික සංඛ්‍යාන වාර්තාව සඳහා තොරතුරු ඒකරාශි කිරීමේ දී, පළාත් මට්ටමින් ඉදිරිපත් කරන්නා වූ තොරතුරු පරස්පර වීම හා තොරතුරු ඒකරාශි කිරීමේ දී මතුවන විවිධ ගැටළු හේතුවෙන් ඒ සඳහා මගපෙන්වීමක් කරනු වස් උපදෙස් ඇතුලත් මාර්ගෝපදේශ සංග්‍රහයක් ප්‍රකාශයට පත්කිරීමට සිදුවිය.

- ක්‍රියාකාරි සැලැස්ම

    2015 වර්ෂයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාකාරීත්වය සැලසුම් ගත කිරීම හා කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනිමින් වර්ෂ ආරම්භයේදී සියළු අංශයන්හි කාර්යභාරය ඒකාබද්ධ කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

    එමෙන්ම සමුපකාර ව්‍යාපාරය පිළිබඳව මහ බැංකු, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන වෙත සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍ය තොරතුරු ලබා දීම ද මෙම වසර තුළ සිදු කරන ලදී.

## 02. 12 මාධ්‍ය කටයුතු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය මගින් සිදුකරනු ලබන ප්‍රමුඛතම කාර්ය වන්නේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව රටේ ජනතාවට තොරතුරු බෙදාදීමයි. ඒ සඳහා 2006 වසරේ සිට සමුපදීපනී පුවත්පත් අතිරේකය නිකුත් කිරීමෙන් එම කාර්ය ඉටු කරනු ලබයි.

සෑම මසකම සිකුරාදා දින සමුපදීපනී සිංහල මාධ්‍ය අතිරේකය පිටු 08 න් යුතුව දිනමිණ පුවත්පත සමග ද දෙමළ මාධ්‍ය අතිරේකය එක් පිටුවකින් යුතුව තිනකරන් පුවත්පත සමග ද එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධ වී ප්‍රකාශයට පත්කරනු ලබයි.

2015 වසරේ ජූනි මාසයේ සිට සමුපදීපනී සිංහල මාධ්‍ය පුවත්පතේ එතෙක් පැවති මුද්‍රණ කඩදාසිය වෙනස් කර නව මුද්‍රණ කඩදාසියකින් යුතුව අන්තර්ගත තොරතුරු තවත් පාඨකයාට සමීප කරමින් මේ දක්වා නිකුත් කරමින් පවතී.

මෙහිදී රට වටා ඇති සමුපකාර සමිති වලින් සාර්ථක සමිති පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය සිට විකාශය දක්වා වාර්තා පළ කිරීම, ලෝක සමුපකාර ව්‍යාපාරය පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම වැනි දෑ සමුපදීපනී පුවත්පතේ පළ කිරීම සිදු විය.

# පරිච්ඡේදය 03

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම්හි කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මඟපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබා දෙන ලදී.

### 03. 1 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී 1227 | 1952.02.02 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.07.26 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සී 2504 | 1973.03.01 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 |
| 06 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | සී 2651 | 1980.11.10 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 |
| 08 | සී/ස ශ්‍රී ලංකා තරුණසේවා සමුපකාර සමිති සංගමය | සී 2689 | 1986.01.01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 |
| 11 | සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය | සමු 29 | 2003.10.07 |
| 12 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | සමු 30 | 2005.11.21 |
| 13 | සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | සමු 33 | 2007.02.23 |

## 03. 2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 39ක් 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

## 03. 2. 1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

- ❖ සමාජික ඉතුරුම් රාශිකරණය
- ❖ සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
- ❖ සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
- ❖ ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්‍ෂණ නියෝජිත සේවා)

# දීප ව්‍යාප්ත ආයතනික මූල්‍ය සේවා සමුපකාර සමිති - 2015

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යොන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | සී 473 | 1928.03.15 |
| 02 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සී 503 | 1928.12.07 |
| 03 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | සී 736 | 1930.11.01 |
| 04 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා ස.ණ.ස | සී 744 | 1930.11.10 |
| 05 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙණු පිළිබඳ සමිතිය | සී 290 | 1938.03.30 |
| 06 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | සී 303 | 1938.04.28 |
| 07 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 255 | 1939.10.20 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභ සාධක සමුපකාර සමිතිය | 1046 | 1943.11.23 |
| 09 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | සී 1649 | 1949.03.29 |
| 10 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරිකිරීමේ සමුපකාර සමිතිය | සී 1707 | 1950.08.30 |
| 11 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2233 | 1959.11.19 |
| 12 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කේ.ඊ. 299 | 1960.05.26 |
| 13 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සී 2266 | 1962.02.10 |
| 14 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සී 326 | 1962.02.10 |
| 15 | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙන සමිතිය | සී 2294 | 1963.01.26 |
| 16 | සමුපකාර දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරි සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2357 | 1962.10.26 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2383 | 1967.10.01 |
| 18 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2402 | 1968.08.29 |
| 19 | සී/ස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සී 931 | 1973.07.25 |
| 20 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | සමු 02 | 1989.12.20 |
| 21 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකරුවන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය | සමු 10 | 1994.02.09 |
| 22 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 18 | 1998.04.06 |
| 23 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | සමු 22 | 2000.06.26 |
| 24 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 25 | 2001.05.05 |

| | | | |
|---|---|---|---|
| 25 | සී/ස ජල සම්පාදන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 31 | 2006.01.03 |
| 26 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 32 | 2006.11.29 |
| 27 | සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘධි සමුපකාර සමිතිය | සමු 43 | 2014.10.02 |

## 03. 2. 2 දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිති වල මූලික කාර්යයන්

- සාමාජිකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම
- නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම
- සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම
- සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය |
|---|---|---|---|
| 01 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | සී 2280 | 1962.08.10 |
| 02 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | සී 2409 | 1969.11.28 |
| 03 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | සමු 03 | 1990.03.07 |
| 04 | ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගේ සමුපකාර සමිතිය | සමු 07 | 1992.01.29 |
| 05 | සී/ස වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | සමු 28 | 2003.07.11 |
| 06 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යාවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | සමු 34 | 2007.03.07 |
| 07 | සී/ස සමස්ත ලංකා කෘෂි කාර්මික සමුපකාර සමිතිය | සමු 41 | 2010.01.05 |
| 08 | සී/ස ශ්‍රී ලංකා වරාය නැව් සේවා සමුපකාර සමිති | සමු 36 | 2011.07.07 |
| 09 | සී/ස නිවාස හා දේපළ සමුපකාර සංවර්ධන සමිතිය | සමු 39 | 2011.07.07 |
| 10 | සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | සමු 40 | 2011.08.28 |
| 11 | සී/ස කිරි නිෂ්පාදකයින්ගේ ජාතික සමුපකාර සමිතිය | සමු 45 | 2014.10.02 |